# වීර්යය සහ අප්‍රමාදය ඃ අනගාරික ධර්මපාලතුමාගේ ලිපි ඇසුරින්

**දිනිති උත්පලා රණසිංහ**[1]

*[1]සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*

**ranasinghedu.uoc@gmail.com*

යම් පුද්ගලයෙකු පිළිබඳ ජීවන තොරතුරු, එම පුද්ගලයාගේ අපේක්ෂා, පරමාර්ථ යනාදිය අධ්‍යයනය කිරීමේ දී පාදක කොට ගත හැකි ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් එම පුද්ගලයා විසින් ලියන ලද ලිපි ලේඛන වැදගත් වේ. ක්‍රි.ව. 1864 සිට 1933 දක්වා ස්වකීය ජීවිත කාලය තුළ ධර්මපාලතුමා විසින් විවිධ පුද්ගලයන් වෙත ලියා යවන ලද ලිපි සමූහයක් දැනට හමුවී ඇති අතර, ඒ ඔස්සේ එතුමා පිළිබඳ විශ්වසනීය තොරතුරු රැසක් අනාවරණය කර ගත හැකි වෙයි. මෙම ලිපිවල සුලබව සඳහන් වී ඇති සංකල්ප ද්වයක් වශයෙන් ''වීර්යය'' සහ ''අප්‍රමාදය'' කැපී පෙනෙයි. විශේෂයෙන් කුඩා සාමණේරවරුන් අමතමින් ලියන ලද ලිපි රාශියක ''බුදුරජාණන් වහන්සේ විසින් උගන්වන ලද ප්‍රධාන ධර්ම දෙක අප්‍රමාදය හා වීර්යයයි'', ''පාලි, හින්දු, උර්දු භාෂා ඉගෙනීමට වීර්යය කළ යුතුය'', ''හින්දියෙන් දේශන කිරීමට වීර්යය කළ යුතුය'', ''අප්‍රමාදව සියලු කටයුතු කරන්නට ඉගෙනගත යුතුය'', ''යමක් ප්‍රමාද වෙලා දැනුම් දීම ප්‍රයෝජන නැත'' ආදී වශයෙන් දක්වමින් වීර්යයෙහි හා අප්‍රමාදයෙහි වැදගත්කම අවධාරණය කොට තිබීමත්, ඒ ඇසුරින් නොයෙක් උපදේශ ලබා දී තිබීමත් දැකිය හැකි ය. මේ අයුරින් වීර්යය සහ අප්‍රමාදය විෂයෙහි ධර්මපාලතුමාගේ දෘෂ්ටිය කවරාකාරද?, වීර්යය හා අප්‍රමාදය පවත්වාගත යුතු අවස්ථා ලෙස එතුමා දක්වන අවස්ථා කවරේද? යන්න සහ අනාගත යති පරපුර වෙත කරනු ලබන එම අවධාරණයන්හි අන්තර්ගත ප්‍රායෝගික වැදගත්කම කුමක්ද? යන්න පිළිබඳව විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ මුඛ්‍ය අරමුණයි. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙහි සංරක්ෂිතව ඇති ධර්මපාලතුමාගේ ලිපි සහ පුස්තකාල විමර්ශන ඇසුරින් මෙම අධ්‍යයනය සඳහා මූලාශ්‍රය සපයා ගැනුණි. ධර්මපාලතුමාගේ දර්ශනය සහ අනාගත යති පරපුර අරබයා එතුමාගේ අභිලාෂය සාක්ෂ්‍ය සහිතව අනාවරණය කිරීමට මෙමගින් හැකියාව ලැබුණි.

මුඛ්‍ය පද ඃ අනගාරික ධර්මපාලතුමා, වීර්යය, අප්‍රමාදය, ලිපි, අනාගත යති පරපුර